**ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 29 දින ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 515.30 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 372.68 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 142.62 ක් හෙවත් සියයට 27.68 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 224.80 | 210.06 | 14.74 | 6.56 |
| මූලධන | 290.50 | 162.62 | 127.98 | 44.02 |
| **එකතුව** | **515.30** | **372.68** | **142.62** | **27.68** |

**2.1 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 23301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 7.37 | 5.54 | 4.37 | 5.99 | 30.00 | 19.08 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 2.15 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0003/000 | 1.59 |
| 6000/0000/00/0018/0004/000 | 0.56 |
| | ----- |
| එකතුව | **2.15** |
| | === |

**2.4 විගණන නිරීක්ෂණය**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ආ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (ඈ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඉ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අදාළ විගණන කටයුතු සිදුකර තිබුණද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදුවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.3 අනුකූල නොවීම

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (අ) | මුදල් රෙගුලාසි 104 (1) | දෙපාර්තමේන්තුවේ වාහන 06 කට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 756 | ගබඩාවේ පැවැති පාරිභෝජන ස්වභාවයේ ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට භාජනය කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 760 | 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාවෙන් පෙන්වා දි තිබුණු භාණ්ඩ අයිතම 08 ක ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**3.4 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

අංකිත බහු මාධ්‍ය අපරාධ විමර්ශන මධ්‍යස්ථානය ඉදිකිරිම සඳහා KOICA විදේශාධාර වශයෙන් රු.මිලියන 90 ක් ලැබි තිබුණි. නමුත් ව්‍යාපෘතිය 2015 ජුනි මාසයේදි ආරම්භ කළ යුතු වුවත්, එය මාස 06 ක ප්‍රමාදයකින් පසුව ව්‍යාපාතියේ කටයුතු ආරම්භ කර තිබුණි.

**3.5 කාර්යසාධනය**

**ආදර්ශන පරික්ෂා කර වාර්තා ඉදිරිපත් කිරිම**

2015 වර්ෂය ආරම්භයේදී දෙපාර්තමේන්තුව වෙත පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරිම සඳහා ආදර්ශන 4,291 ක් තිබුණි. සමාලෝචිත වර්ෂයේදී තවත් ආදර්ශන 26,443 ක් ලැබී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් ආදර්ශන 30,734 ක් පරික්ෂා කර වාර්තා ඉදිරිපත් කිරිම කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ආදර්ශන 26,779 ක් පරික්ෂා කර වාර්තා ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පරීක්ෂා කර නොතිබුණු ආදර්ශන ගණන 3,955 ක් වි තිබුණි. පරික්ෂා කර නොතිබුණු ආදර්ශන සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී එම ආදර්ශනවලින් 272 ක් හෙවත් සියයට 7 ක ප්‍රමාණයක් වර්ෂ 10 කට අධික කාලයක සිට පරීක්ෂා නොකර ඉදිරියට ගෙන එමින් පැවැතුණි. එම පරීක්ෂා නොකර ඉදිරියට ගෙන එමින් තිබුණු ආදර්ශනවල කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| පරික්ෂා නොකර අත රැදි ආදර්ශනවල කාලය | ආදර්ශන ගණන | අතරැදි ආදර්ශන ගණනේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| වර්ෂ 01 කට අඩු | 1,529 | 39 |
| වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු | 1,136 | 28 |
| වර්ෂ 03 කට වැඩි වර්ෂ 05 කට අඩු | 389 | 10 |
| වර්ෂ 05 කට වැඩි වර්ෂ 10 කට අඩු | 629 | 16 |
| වර්ෂ 10 කට වැඩි | 272 | 07 |
| එකතුව | 3,955 | 100 |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 90 | 74 | 16 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 02 | 08 |
| (iii) | ද්විතියික මට්ටම | 119 | 86 | 33 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 78 | 67 | 11 |
| | **එකතුව** | **297** | **229** | **68** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු 68 අතරින් පුරප්පාඩු 06 ක් සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත්කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.665,485 ක දීමනා ගෙවා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයෙන් මස්තු විද්‍යා අංශය සඳහා නිලධාරීන් 22 ක්ද, මත් ද්‍රව්‍ය අංශය සඳහා නිලධාරීන් 29 ක්ද, ධූලක විද්‍යා අංශය සඳහා නිලධාරීන් 29 ක්ද වශයෙන් නිලධාරීන් 80 දෙනෙකු අනුයුක්ත කර තිබුණද, එම අංශවලට ලැබී තිබූ ආදර්ශන පරීක්ෂාකර වාර්තා නිකුත් කිරීමේ ප්‍රගතිය සියයට 78 ක මට්ටමක පැවැතුණි.